# උතුරු නැගෙනහිර ප්‍රශ්නය හා නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය

නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය යනු දැනුම පිළිබඳ ප්‍රවාදයකි. දැනුම ගැනත් දැනුම නිර්මාණය කෙරෙනා ආකරයත්, දැනුම නිර්මාණය කරන්නේ කවර හේතු නිසා ද යන වගත් එහි දී සාකච්ජා වේ.

බටහිර දර්ශනයේ දී දැනුමේ ප්‍රභවය ගැන කියැවෙන විට ප්‍රධාන වාද දෙකක් ගැන සඳහන් වේ. ඒ බුද්ධිවාදය සහ අනුභූතිවාදයයි. බුද්ධිවාදීන් පවසන්නේ දැනුමේ ප්‍රභවය ශුද්ධ විචාර බුද්ධිය බවයි. ඔවුහු ඉන්ද්‍රියයන් හරහා ලැබෙන දැනුම ප්‍රතික්ෂේප කරන බව පවසති. අනෙක් අතට අනුභූතිවාදීන් පවසන්නේ දැනුම ලැබෙන්නේ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් පමණක් බවයි. මේ වාද දෙකේ දී ම සෘජුව ම නො පැවසුණ ද වාස්තවික වූ දැනුමක් ඇති බව පිළිගැනෙයි. එනම් මනසින් පරිබාහිරව ඇති යථාර්ථයක් ගැන කතා කෙරෙයි. එහෙත් නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ දී කවර හෝ වාස්තවික දැනුමක් ප්‍රතික්ෂේප කෙරෙන අතර සියලු දැනුම ඒ නිපැදවූවන් ගෙ මනසට ඉන්ද්‍රිය පද්ධතියට සහ සංස්කෘතියට සාපේක්ෂ බව පැවසේ.

දැනුම පිළිබඳ මේ නව ප්‍රවාදය ඔස්සේ යම් ආකාරයක චින්තන විප්ලවයකට මගපෑදිණි. එය මෙරට චින්තනය ප්‍රතික්ෂේප කර නව චින්තනයක් කරා යෑමක් නො ව පැවැති චින්තනය අළු ගසා නැගිටුවීමක් ලෙස හැඳින්වීම නිවැරැදි ය. 1986 වසර මේ අදහස් ජාතියට පිළිගැන්වූ වසර ලෙස හැඳින්විය හැකි ය. ආරම්භයේ පමණක් නො ව අද ද ඇතැමුන්'අසන ප්‍රශ්න නම් "මේ දර්ශනය මොනවා කරන්නට ද? මේවායින් ඇති වැඩේ කුමක් ද? දර්ශනය කන්න ද?" යනාදියයි. ශක්තිමත් ගොඩනැගිල්ලක් නිර්මාණයට හොඳ පාදමක් තිබිය යුතු ය. හොඳ අමුද්‍රව්‍ය යොදාගත යුතු ය. දක්ෂ පෙදරේරුවන් සිටිය යුතු ය. සියල්ලට වඩා හොඳ සැලසුමක් තිබිය යුතු ය. පළමුව ශක්තිමත් පාදම මත ගොඩනැගිල්ලේ සැකිල්ල නිර්මාණය කරගත යුතු ය. උළුවහු අල්ලා, බිත්ති කපරාදු කර ඉතිරි වැඩ පසුවට ය.

දැනුම පිළිබඳ කතන්දරය මේ ආකාර ය. පළමුව අපේ ඥාන විභාගයක් (එනම් දැනුම පිළිබඳ ප්‍රවාදයක්) නිර්මාණය කර, අපේ දාර්ශනික පසුබිම හා අපේ ආකල්ප මොනවා දැයි හඳුනාගත යුතු ය. එනම් අපේ චින්තනය කුමක් දැයි නිවැරැදි ව හඳුනාගත හැකි ය. නව දැනුම නිර්මාණයට, නව නිර්මාණ කිරීමට පසුබිම සකස් වන්නේ එවිට ය. අපේ නො වන චින්තන කවරේ ද ඒ චින්තන මත ගොඩනැගුණු දැනුම කවරේ දැයි හඳුනාගත හැක්කේ එවිට ය. වෙනත් දැනුම් පද්ධතිවල ඇති අපට සුදුසු දැනුම තෝරා බේරාගෙන අවශෝෂණය කිරීමටත් නුසුදුසු දෑ ප්‍රතික්ෂේප කිරීමටත් හැකි වන්නේ එවිට ය. යමක් ආරම්භ කර ඉදිරියට රැගෙන ආ විට ඒ ගැන හැඳින්වීම් ලිවීමත්, ඒ ඔස්සේ ගමන් කිරීමත් එතරම් අපහසු කටයුත්තක් නො වේ. අපහසු වන්නේ එවැන්නක් ඇරඹීමයි. එය කෙතරම් අපහසු දෙයක් වී දැයි අවබෝධ කරගත හැක්කේ ක්‍රි.ව. 4-5 සියවස්වල සිට සියවස් 15ක් පමණ ම එවැන්නක් ඇරඹීමට හෝ එවැනි දාර්ශනික වැඩපිළිවෙළකට නායකත්වය සැපයීමට හෝ කවරකු හෝ ඉදිරිපත් නො වීමෙනි. ඉදිරිපත් වූව ද එවැන්නක් සාර්ථක නො වීමෙනි.

1986 සිට අද වන විට වසර විස්සකට මඳක් වැඩි කලක් ගත වී ඇත. පුද්ගලයකු ගේ ජීවිත කාලයට සාපේක්ෂව, ඇතැම් බටහිර ජාතියක වයසට සාපේක්ෂව නොඑසේ නම් සියල්ල මේ භවයෙන් අවසාන යැයි අදහන භෞතිකවාදියකුට උච්ඡේදවාදියකුට සාපේක්ෂව වසර 20ක් යනු කෙටි කාල සීමාවකි. එහෙත් මේ වසර 20 තුළ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය මත පදනම් ව ලෝකය දෙස බැලීමෙන් (ලෝකය නිර්මාණය කර ගැනීමෙන්) අප ලබා ඇති ජයග්‍රහණය සුළු පටු නො වේ. වියුක්ත ලෙස සිතීමේ දක්ෂ අයකුට එම ජයග්‍රහණ ද සලකා බලා අනාගතයේ දී රටට, ජාතියට මේ රටේ මිනිසුන්ට ඒ තුළින් උදා වන යහපත ගැන අදහසක් ඇති කර ගැනීම එතරම් අපහසු නො වෙයි.

පසුගිය දශක දෙකක කාලය තුළ මේ ඔස්සේ ලැබූ ප්‍රධානතම ජයග්‍රහණයක් නම් අපේ රටේ උතුරු සහ නැගෙනහිර පළාත්වල ඇති ව තිබූ අර්බුදය පිළිබඳ වඩා සංගත නිරවුල් දැනුමක් නිර්මාණය කරගත හැකි වීමයි. එක් දහස් නව සිය අනූව දශකය ඇරඹෙන විටත් බොහෝ දෙනකුට අනුව උතුරේ සහ නැගෙනහිර තිබුණේ ජනවාර්ගික ගැටලුවකි. එහි ආරම්භය 83 කළු ජූලිය හෝ 1956 හෝ විය.

දැනුම ගොඩනැගෙන්නේ මනසට, ඉන්ද්‍රිය පද්ධතියට සහ සංස්කෘතියට සාපේක්ෂව යැයි පැවසූ විට ලෝකයේ එක් දැනුමක් තිබිය නොහැකි ය. පුළුල් ලෙස සැලකූ විට දැනුම ගොඩනැගෙන "චින්තනය" නම් සංකල්පය ඇසුරෙන් ලෝකයේ අවම වශයෙන් ප්‍රධාන දැනුම් පද්ධති කිහිපයක් හෝ තිබිය යුතු ය. ලෝකයේ ඇත්තේ එක් සංස්කෘතියක් නො වේ. එක් මිනිස් කොට්ඨාසයක් පමණක් නො වේ. ඒ අනුව අද වන විට ලෝකයේ ආධිපත්‍යය දරන චින්තනය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ලෙස හඳුනාගත් අතර අධිපති සංස්කෘතිය යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ලෙස හඳුනාගනු ලැබිණි. මෙහි දී අවධාරණය කර කිව යුත්තේ මෙහි ක්‍රිස්තියානි යනුවෙන් යොදා ඇත්තේ හුදු ආගමික අරුතින් නො වන බවත් අදාළ චින්තනයේ සහ සංස්කෘතියේ විකාශය සලකා බලා බවත් ය. එකී චින්තනයේ සහ සංස්කෘතියේ නිසග ගුණයක් වූයේ ලොව අනෙකුත් චින්තන ක්‍රම, සංස්කෘති, දැනුම් පද්ධති විනාශ කරමින් තම චින්තනය සංස්කෘතිය සහ දැනුම් පද්ධතිය පමණක් ලෝකයේ ඉතිරි විය යුතු බව ඇදහීමයි. එය සාක්ෂාත් කර ගැනීමට ලෝකයේ ඇති වෙනත් චින්තන, සංස්කෘති, දැනුම් පද්ධති විනාශ කර දැමිය යුතු ය. බටහිරයන් පොදු වශයෙන් සැලකූ විට සෑම සියලු දෙයක් ම කරන්නේ ඒ අරමුණ සාක්ෂාත් වන ආකාරයට ය. මේ අනුව අපේ උතුරු නැගෙනහිර අර්බුදය ද බටහිරයන් ගේ එම ව්‍යාපෘතියේ ම කොටසක් ලෙස හඳුනාගනු ලැබිණි. සිංහලයන් මේ මොහොතේ දේශපාලනිකව සහ ආර්ථිකව ලෝක සන්දර්භය තුළ ප්‍රබල ස්ථානයක් හිමි කර නො ගත්ත ද සංස්කෘතික අතින් ඔවුන් අතිශයින් ප්‍රබල ය. වසර දහස් ගණනක් පුරා පෝෂණය වූ අනන්‍ය, අඛණ්ඩ සංස්කෘතියක් ඔවුනට හිමි ය. ඒ තුළ ගොඩනැගෙන දැනුමකින් දේශපාලන සහ ආර්ථික ක්ෂේත්‍රවල ද ජාතිය ඉහළට ම ඔසවා තැබීමේ ශක්‍යතාවකින් මේ සංස්කෘතිය හෙබි ය. අප ආක්‍රමණය කළ බටහිර ජාතීන්ට අපේ සංස්කෘතිය ගුඪ එකක් විය. ගමේ පන්සලේ හාමුදුරුවන් සහ ගම අතර පැවැති සබඳතාව ඔවුහු නො ඉවසූ හ. විශේෂයෙන් ඒ සබඳකම ඔස්සේ 1818 වසරේ දී ඉංග්‍රිසින්ට එල්ල වූ යුධ ප්‍රහාරය ලොව කොතැනක දී හෝ ඔවුන්ට මුහුණ නො දුන් ආකාරයේ එකකි. තමන්ට අභියෝගයක් වන මේ ජාතිය, සංස්කෘතිය ක්‍රමයෙන් අඩපණ කළ යුතු බව ඉංග්‍රීසින් තීරණය කරන්නේ ඒ සමග ය. ඒ සඳහා ඔවුන් යොදාගන්නේ ඊට සියවසකට පමණ පෙර දකුණු ඉන්දියාවේ මලබාර් වෙරළ ප්‍රදේශයෙන් රැගෙන විත් ලන්දේසීන් විසින් යාපනය අර්ධද්වීපයේ පදිංචි කළ දෙමළ ජනතාව ය. 1818 නිදහස් අරගලය මැඩපැවැත්වීමෙන් පසු මේ දෙමළ ජනතාවට සුවිශේෂ වරප්‍රසාද ලබා දී සිංහලයන් යටපත් කිරීමට ඔවුන් යොදාගන්නා ලදී. අප රටේ උතුරු නැගෙනහිර ප්‍රදේශවල අත්දැකි අර්බුදය ඉංග්‍රීසි යටත්විජිත පාලකයන් නිර්මාණය කළ එකකි. එක් සංස්කෘතියක්, එක් දැනුමක්, එක් විද්‍යාවක්, එක් ලෝක පාලනයක් උදෙසා බටහිරයන් දියත් කරන ව්‍යාපෘතියේ කොටසක් ලෙස අපේ රටේ ප්‍රශ්නය හඳුනාගත හැකි වූයේ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ දාර්ශනික ඇස හේතුවෙනි.

පළමුව ප්‍රශ්නයේ මුල නිවැරැදිව හඳුනා ගැනුණු අතර ප්‍රශ්නය විකාශය වූ ආකාරය එයට දායක වූවන් සහ අද වන විට එය ඔඩුදුවා ඇති අයුරු ඉන්පසු හඳුනා ගැනිණි. අවසානයේ ප්‍රශ්නය සඳහා දිය යුතු විසඳුම ද ඉදිරිපත් කෙරිණි. ඉංග්‍රීසින් නිර්මාණය කර පෝෂණය කළ දෙමළ ජාතිවාදය මතවාදීයව, යුධමය වශයෙන් සහ දේශපාලනිකව පරාජය කළ යුතු බව එහි දී පැවසිණි. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය පිළිබඳ මුල් අදහස් ඉදිරිපත් වී දශකයක් යෑමටත් පෙර මේ කරුණු නිරවුල්ව ඉදිරිපත් වුව ද ඒ ඔස්සේ යමින් ප්‍රශ්නය ග්‍රහණය කරගත හැකි දේශපාලන සහ යුධමය නායකත්වයක් නිර්මාණය කර ගැනුමට තවත් දශකයක් පමණ ගත විය. එය සිදු වූ ආකාරය ද දැක්විය හැකි වුව ද එවැනි සෘජු දේශපාලනික කරුණු විදුසර සීමාවෙන් පිටතට විහිදී යයි.

රටේ උතුරු සහ නැගෙනහිර ප්‍රශ්නයට නිවැරැදි විසඳුමක් ඉදිරිපත් කිරීමටත් එම විසඳුම ක්‍රියාත්මක කෙරෙන තැනට කටයුතු යෙදීමටත් "නිර්මාණාත්මක සාපේක්ෂතා-වාදය ඉටුකළ කාර්යභාරය නො දන්නා පුද්ගලයන් බොහොමයක් ද අද උතුරේ සටන ජයග්‍රාහීව ඉදිරියට යන විට එහි උරුමය පතා ඉදිරිපත් ව සිටිනු දක්නට ලැබෙයි. ඒ බොහෝ දෙනෙක් ප්‍රශ්නය නිවැරැදිව හඳුනාගෙන ඊට විසඳුම ඉදිරිපත් කරද්දී ඊට එරෙහි වූවෝ වෙති. ඇතැමකුට අනුව කොටි ත්‍රස්තවාදය පරාජය කළ නොහැකි එකක් විය. තවත් සමහරුන්ට අනුව මෙය ජාතිවාදී වර්ගවාදී ප්‍රශ්නය හඳුනා ගැනීමක් සහ විසඳුමක් විය. අද කොටි පැරදවීමේ මල් වට්ටියට අත ගසා ඇති බොහෝ දෙනා අදින් වසර 15කට පෙර ලබා දුන් පුවත්පත් සාකච්ඡා, ඇලවූ පෝස්ටර ආදිය විමසා බැලීමෙන් මේ කරුණු අවබෝධ කරගත හැකි ය. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය මත ගොඩනැගුණු දැනුමකින් පැවසෙන අයුරට කටයුතු කිරීමට හෝ ඒ මගපෙන්වීම ඔස්සේ ගමන් කිරීමට ඒ හා බැඳෙන සියලු දාර්ශනික කරුණු අවබෝධ කරගත යුතු යැයි මින් නො පැවසේ. එහෙත් යමක් පළමුව පෙන්වා දුන් විට එය පෙන්වා දුන්නේ කවුරුන් දැයි පැවසීමට මැලි වීම, එය සැඟවීම නොමනා

කටයුත්තකි. මල් වට්ටියට අත ගැසීම ද හොඳ කටයුත්තකි. එසේ වුවත් පන් කපා, වියළා, වට්ටිය වියා, මල් නෙළා, පිළිවෙළට එවා තබා, පිදිය යුතු ලෙසට මල් වට්ටිය සකස් කළේ කවුරුන් ද යන වග අමතක නො කළ යුතු ය.

යම් හෙයකින් මෙවැනි සංගත නිරවුල් දැනුමක් නිර්මාණය නො විණි නම් ඉදිරිපත් වූ විජාතික මතවාද ජයග්‍රහණය කෙරුමට ඉඩ තිබූ අතර ඒකීය රටක්, නිවහල් දැයක් ගැන බලාපොරොත්තු තව සියවස් ගණනාවකින් පස්සට යෑමට ඉඩ තිබිණි.

*රජරට වෛද්‍ය පීඨයේ කථිකාචාර්ය*
**වෛද්‍ය චන්න සුදත් ජයසුමන**